**ගිවිසුමේ අංකය:- ....................**

# අවබෝධතා ගිවිසුම

මෙම අවබෝධතා ගිවිසුම .......................... වර්ෂයේ ................... මාසයේ .................................. එක් පාර්ශ්වයක් ලෙස මෙහි පහත අත්සන් කරන ............................................................................................ වන මම (මොහු මින් පසු "සභාපති කොටපොල ප්‍රාදේශීය සභාව / මහනගර සභාව" යනුවෙන් හැඳින්වෙන අතර එයින් ඔහුගෙන් පසු නිල අනුප්‍රාප්තිකයෝද අදහස් කෙරෙයි) අනික් පාර්ශ්වය වන ............................................................ සමඟ (මොහු මින් පසු කොටපොල ..................................................... යනුවෙන් හැඳින්වෙන අතර එයින් ඔහුගෙන් පසු නිල අනුප්‍රාප්තිකයෝද අදහස් කෙරෙයි) උක්ත ගිවිසුම් අංකය යටතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කය තුල ................................................................................................................................................ වැඩසටහන යටතේ .................... වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත........................................... .......................................................................................... ව්‍යාපෘතිය සඳහා රු........................ මුදලක් සඳහා පහත දැක්වෙන කොන්දේසි ප්‍රකාරව කටයුතු කරගෙන යාමට පොරොන්දු වෙමු.

**කොන්දේසි.**

1. ................................................................................................................................................ වැඩසටහන යටතේ ........................ වර්ෂය ............................................................ වැඩ විස්තරය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු /පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ඉංජිනේරු / ............................................................. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී / .................................. ප්‍රාදේශීය සභාවේ /නගර සභාවේ /මහනගර සභාවේ තාක්ෂණ නිලධාරී අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ.

2. ................................................................................................................................................ වැඩ සටහනට අදාලව මෙතෙක් නිකුත් කර ඇති චක්‍ර ලේඛ හා උපදෙස් වලට යටත්ව ක්‍රියාත්මක වන ව්‍යාපෘති පමණක් මෙම ගිවිසුමට යටත් වන අතර වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලයක් නැත.

3. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාව /වැඩසටහන් හඳුන්වා දෙන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛ උපදෙස් වලට අදාල වන වගන්ති වලට එකඟ වෙමි.

4. සභාපති /නගරාධිපති .................................. ප්‍රාදේශීය සභාව/නගර සභාව /මහනගර සභාව විසින් සෑම මසකම මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඊළඟ මස 05 වන දිනට පෙර විෂය කරුණු දක්වමින් ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

5. ................................................................................................................................................ වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කය තුළ සිදු කෙරෙන උක්ත ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඍජු අධීක්ෂණය යටතට ලක් වන අතර මෙම ව්‍යාපෘති වල ප්‍රමිතිය පිළිබඳ වගකීම .................................. ප්‍රාදේශීය සභාවේ සභාපති/නගර සභාවේ නගරාධිපති/මහනගර සභාවේ නගරාධිපති විසින් හා භෞතික ප්‍රගතිය සම්බන්ධව වගකීම .................................. ප්‍රාදේශීය සභාවේ සභාපති/නගර සභාවේ නගරාධිපති/මහනගර සභාවේ නගරාධිපති හා .................................. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සතු වන්නේය.

6. මෙම ව්‍යාපෘතිය පිළිබඳ විධිමත් සැලසුම් ඇස්තමේන්තු හා වැඩ පිරිවිතර පිළිබඳ උපදෙස් .................................. ප්‍රාදේශීය සභාව /නගර සභාව /මහනගර සභාව /විසින් පිළියෙල කළ යුතු අතර එම ලිපි ලේඛන සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත් පසු ව්‍යාපෘතිය පිළිබඳ කටයුතු ආරම්භ කළ හැකි අතර ඒ අනුව ව්‍යාපෘතිය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව අවසන් කළ යුතුය.

7. මෙම වැඩසටහනට අනුව ප්‍රාදේශීය ලේකම්වරයා ගෙවීම් බලධරයා වන අතර ප්‍රාදේශීය සභාව/ නගර සභාව / මහනගර සභාව යනු ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ඒ අනුව ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් අනුගමනය කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් විසින් වරින් වර නිකුත් කරන උපදෙස් අනුවද කටයුතු කිරීමට දෙපාර්ශවයම බැඳී සිටී. එසේම ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය ලෙස ප්‍රාදේශීය සභාව / නගර සභාව/ මහනගර සභාව කටයුතු කරන අතර, ප්‍රජා මූල සංවිධාන සමඟ ගිවිසුම්ගත වන්නේ නම් ගිවිසුම් ගත වූ වහාම එකී ගිවිසුම්වල මුල් පිටපතක් ගෙවීම් බලධරයා වෙත ලබා දිය යුතු වේ.

8. උක්ත කරුණු සම්බන්ධව ලැබෙන ප්‍රතිපාදන යටතේ සිදු කෙරෙන සියලුම ගෙවීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍ර ලේඛ, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය................................... අමාත්‍යාංශය වරින් වර නිකුත් කර තිබූ උපදෙස් හා චක්‍ර ලේඛ වලට අනුකූල විය යුතුය. ඒ අනුව වන සියලුම ගෙවීම් ප්‍රාදේශීය සභාව/ නගර සභාව / මහනගර සභාව විසින් කරන ගෙවීම් සම්බන්ධව ද මෙම වගන්තිය යටතේ වන වගකීම් වලට යටත් වනු ඇත.

9. වැඩය නිම කොට භාර දී මාස ................... ක් යන තුරු රැඳවුම් මුදල් රඳවා ගත යුතුය. එම කාල පරිච්ඡේදය ඇතුළත එම වැඩයෙහි යම් අඩු ලුහුඬුකමක් දකින්නට ලැබුණහොත්, එම අඩු ලුහුඬුකම් සම්පූර්ණ කර දෙන ලෙස තමාට නියම කරන කොයි යම් විටකදී වුවත්, ............................... ප්‍රාදේශීය සභාවේ / නගර සභාවේ / මහනගර සභාවේ නගරාධිපති/ සභාපති විසින් එම වියදම් කළමනාකරණය හා පරිපාලනය කොට ඒ ගැන වාර්තා කිරීමට ඉහත සඳහන් පරිදි විධි වූ ප්‍රකාර පත් කරන ලද නිලධාරීන්ට මැනවින් ඒත්තු යන ලෙස එකී අඩු ලුහුඬුකම් ආදිය සම්පූර්ණ කොට දිය යුතුය.

10. අනුමත කරන ලද ඇස්තමේන්තුව ඉක්මවා කටයුතු කිරීමට කිසිදු පාර්ශවයකට බලය නොමැති අතර අමතර ප්‍රතිපාදන අවශ්‍ය වුවහොත් ඒ පිළිබඳ තීරණ ගැනීමේ බලය ........................................ අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේය.

11. මෙම ව්‍යාපෘතියේ වැඩ ...................................................... දිනට පෙර අවසන් කර ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කළ යුතු අතර, කිසිසේත් අවිච්ඡේද නොකළ යුතුය.

12. ව්‍යාපෘතියට අදාළව වැඩ නිම වූ පසු (මාර්ගයේ) කොන්ක්‍රීට් කියුබ් සහ කුට්ටිගල් වල සම්පිණ්ඩතා ශක්තිය මැනීම ප්‍රාදේශීය කාර්යාලය නම් කරන නිලධාරියෙකුගේ සහභාගීත්වය ඇතිව ප්‍රාදේශීය සභාව / නගර සභාව / මහනගර සභාව සිදුකළ යුතු අතර, ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කළ වාර්තාව (completion report) ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදිය යුතුය.

13. ඉදිකිරීමේ ප්‍රමිතිය සම්බන්ධයෙන් යම් අක්‍රමිකතාවක් පිළිබඳව පැමිණිලි ලැබුණහොත් ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු හා දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ ඇතුළත් තිදෙනෙකුගෙන් සමන්විත විමසුම් කමිටුවක නිර්දේශ මත දිස්ත්‍රික් ලේකම් විසින් අවසන් තීරණය ලබා දෙනු ඇත. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව හටගන්නා වූ මතභේද හා ආරවුල් බේරුම් කිරීමේ වගකීමද දිස්ත්‍රික් ලේකම් සතු වන්නේය.

දෙපාර්ශවයේ පූර්ණ එකඟතාවය මත ඉහත කරුණු වලට එකඟව ............................... වැනිදා පහත සාක්ෂිකරුවන් සහිතව ............................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

සභාපති/නගරාධිපති ප්‍රාදේශීය ලේකම්

.............................. ......................................

ප්‍රාදේශීය සභාව/ නගර සභාව / මහනගර සභාව ප්‍රාදේශීය ලේකම්

සාක්ෂි 1. ............................... සාක්ෂි 1. ...............................

2. ............................... 2. ...............................